## රුසියාව, ශ්‍රී ලංකාව සහ බංග්ලාදේශ විශ්වවිද්‍යාලයන්හි අධ්‍යාපන ක්‍රියාවලිය බලශක්ති කාර්යක්ෂමතාවය හා දේශගුණික විපර්යාස හා බැඳුණු පාරිභෝගික චර්යාව හා සමඟ අනුබද්ධ කිරීමේ ව්‍යාපෘතිය

### හැඳින්වීම

ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ ආසියානු උසස් අධ්‍යාපන ආයතනයන්හි ජාත්‍යන්තරීකරණ උපායමාර්ග සහ මෙවලම්වල අවශ්‍යතා සහ ප්‍රමුඛතා හඳුනාගැනීමයි. ව්‍යාපෘතිය මඟින් පසුකාලීනව දැනුම බෙදාහැරීමේ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් එලෙස හඳුනාගන්නා අවශ්‍යතා සහ ප්‍රමුඛතා අනුව හැඩගස්වා ගනු ඇත. මේ යටතේ මියන්මාරය,ලාඕසය සහ කාම්බෝජියාව යන රටවල මේ වන විටත් භාවිතයේ පවතින ජාත්‍යන්තරීකරණ උපායමාරග සහ මෙවලම් පිළිබඳව අධ්‍යනය කර යුරෝපා සංගමයට අයත් විශ්වවිද්‍යාලයන්හි දී පුහුණු කටයුතු සිදුකරනු ඇත.ඒ යටතේ ආසියානු නවෝත්පාදන සහ පර්යේෂණ ආයතන (IRO) වලට උපායමාර්ගික නවෝත්පාදන සහ පර්යේෂණ (IR) සැලසුම් යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් අධ්‍යාපනික ව්‍යාපෘති ලිවීම හා කළමනාකරණය මෙන්ම හුවමාරු වැඩසටහන් කළමනාකරණය පිළිබඳව ද මේ යටතේ පුහුණුවක් ලබාදෙනු ඇත. මෙලෙස මෙම දැනුම හා ශක්‍යතාවයන් උගනීම මෙන්ම අනතුරුව මෙම ආයතන, සම්මන්ත්‍රණ සහ වැඩමුළු හරහා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන දැනුවත් කිරීමට කටයුතු කෙරෙනු ඇත. තවද ආසියානු පාර්ශවකරුවන් විසින් නවෝත්පාදන සහ පර්යේෂණ (IR) ක්‍රියාකාරකම්හි නිරත ශාස්ත්‍රාලික ප්‍රජාවන් සහ විද්‍යාර්ථීන් පුහුණු කිරීමටද කටයුතු කෙරෙනු ඇත. මේ අයුරින් මෙම ව්‍යාපෘතිය තත්‍ය සහ දිර්ඝකාලීන ප්‍රතිඵල ළඟාකරගැනීම උදෙසා ශාස්ත්‍රාලීය නායකයන් හා ජාතික ප්‍රතිපත්ති සම්පාදකයන් ද පුහුණුවට ලක්කෙරෙනු ලැබේ. ඒ යටතේ ඔවුන්ගේ නවෝත්පාදන ජාත්‍යාන්තරීකරණ න්‍යාය පත්‍රයන් වඩා ප්‍රගතිශීලී මට්ටමක් කරා ගෙනයාමට අවශ්‍යය දැනුවත් කිරීම් සිදුකෙරෙනු ඇත.

අවසාන වශයෙන්, ව්‍යාපෘතියෙහි මෙවලම් , දැනුම බෙදාහැරීම, එහි ප්‍රතිඵලයක් ක්‍රියාකාරී ලෙස භාවිතයට ගැනීම හා තිරසාරත්වය පදනම් වනු ඇත්තේ හඳුන්වාදෙනු ලබන MOOC පාඨමාලාව, ව්‍යාපෘති කළමනාකරණය සඳහා වන උපකාරක සේවාවක් මෙන්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයක් හරහා වන අතර ඉන් ආසියානු උසස් අධ්‍යාපන අයතනවල අවශ්‍යතා කෙරෙහි ජාත්‍යන්තර ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අවධානය යොමුකරගැනීමට බලාපොරොත්තු වේ.